# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1700/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 11/11/2024<br>පැය 1715 |

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - සිරිපාගම පොලිස් වසම.

2024.11.11 වන දින අළුයම් කාලයේදී සිරිපාගම පොලිස් වසමේ මැදගම, ගිලිමලේ ප්‍රදේශයේ පතල් වාඩියක පුද්ගලයින් දෙදෙනෙකු අතර ඇතිවූ බහින්බස් වීමක් දුරදිග යාම හේතුවෙන් එක් පුද්ගලයෙකු විසින් අනෙක් පුද්ගලයාට කුළු ගෙඩියකින් පහරදීමෙන් මියගොස් ඇති බවට සිරිපාගම පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 54ක් වූ ගිලිමලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම පුද්ගලයින් දෙදෙනා පාගොඩ වෙල්යායේ පතල් වාඩියක් තුලදී ගුවන්විදුලියක් ක්‍රියා කරවීමට ගොස් ඇතිවූ බහින්බස්වීමක් දුරදිග යාම හේතුවෙන් මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදුකරනලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. **ඝාතනයට සම්බන්ධ සැකකරු පලා යමින් සිටියදී මැදග ප්‍රදේශයේ ගම්වාසීන් විසින් අල්ලා පොලිස් නිලධාරීන් වෙත භාරදීමට ක්‍රියා කර ඇත. සැකකරු වයස අවුරුදු 59 ක් වන පාදුක්ක ප්‍රදේශයේ** පදිංචි පුද්ගලයෙකි. සිරිපාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - ගොකරැල්ල පොලිස් වසම.

2024.11.11 වන දින උදෑසන කාලයේ ගොකරැල්ල පොලිස් වසමේ කුරුණෑගල දඹුල්ල මාර්ගයේ දෙහෙල්ගමුව හන්දිය ආසන්න ප්‍රදේශයේදී කුරුණෑගල දෙස සිට දඹුල්ල දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගය හරහා ගමන්කළ පදිකයකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා ගොකරැල්ල රෝහලට ඇතුලත් කිරිමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 94 ක් වූ ඉබ්බාගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගොකරැල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. ගොකරැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**